# 10 ශ්‍රේණිය

# ගෘහ ආර්ථික විද්‍යාව

## පෙරහුරු අභ්‍යාස




නිපුණතාව 10

ගෘහීය අවශ්‍යතා සඳහා නිර්මාණ සකස් කිරීමේ දී විවිධ මැහුම් ක්‍රම යොදා ගනියි.

නිපුණතාව 11

පුද්ගල අවශ්‍යතා සඳහා රෙදි වර්ග හඳුනාගෙන ඇඳුම් නිර්මාණය කරයි.

එම්.ඒ.රේණුකා පී. පෙරේරා මිය. විශ්‍රාමික ගුරු උපදේශක

කලාප අධ්‍යාපන කාර්යාලය. මිනුවන්ගොඩ.

ඔබේ පෙළපොතේ 10- විවිධ මැහුම් ක්‍රම පාඩම හා 11 -ඇඳුම් නිර්මාණය කිරීම යන පාඩම අධ්‍යයනය කර පහත අභ්‍යාස වලට පිළිතුරු සපයන්න.

වඩාත්ම නිවැරදි පිළිතුර තෝරන්න.

1 . මූලික මැහුම් ක්‍රම දෙකක් වන්නේ,

(1) වාටි මැස්ම සහ නැටි මැස්ම ය.

(2) සැටින් මැස්ම සහ පිස්මේන්තු මැස්ම ය.

(3) දම්වැල් මැස්ම සහ සිහින් නූල් දිවවීම ය.

(4) සිහින් නූල් දුවවීම සහ සැඟි වාටි මැස්ම ය.

2. මූට්ටුවක නොමැසූ අද්දර නිම කළ හැකි මැහුම් ක්‍රමයකි.

(1) බොත්තම් කාස මැස්ම . (2) සන්නාලි වාටි මැස්ම.

(3) සැඟි වාටි මැස්ම . (4) බ්ලැන්කට් මැස්ම.

3 . ක්විල්ට් කිරිමට යොදා ගන්නා මැස්මක් වන්නේ,

(1) සිහින් දුවවීම ය . (2) නැටි මැස්ම ය .

(3) බ්ලැන්කට් මැස්ම ය . (4) පිස්මේන්තු මැස්ම ය.

4. රෙද්දේ හොඳ පසින් මසන මැස්ම දැකිය හැකි මූට්ටුවකි.

(1) පැතලි මූට්ටුව ය. (2) අතිච්ඡාදන මූට්ටුව ය.

(3) විවෘත පැතලි මූට්ටුව ය. (4) ප්‍රංශ මූට්ටුව ය.

5. ටෙරලීන් හා නයිලෝන් යන කෙඳි වර්ග අයත් වන්නේ,

(1) අර්ධ කෘත්‍රිම කෙඳි වලට ය . (2) ශාකමය කෙඳිවලට ය.

(3) ඛනිජ කෙඳි වලට ය. (4) කෘතිම කෙඳි වලට ය.

6. මූලික මැහුම් ක්‍රම පිළිබඳව තොරතුරක් පහත් දැක්වේ.

- දකුණේ සිට වමට මසනු ලැබේ.
- ස්ථිර මැහුම් ක්‍රමයක් වේ.
- මැස්මේ නොපිට පස ද ක්‍රමවත් ය.
- මූට්ටු කිරීමට ද යොදාගත හැකි ය.

ඉහත සඳහන් මැහුම් ක්‍රමය වන්නේ,

(1) වාටි මැස්ම ය . (2) සිහින් නූල් දුව වීම ය .

(3) නැටි මැස්ම ය. (4) පිස්මේන්තු මැස්ම ය.

7. මේ අතරින් අක් සැරසිලි වලට අයත් වන්නේ,

(1) විසිතුරු රැළි ය . (2) පිහිතල පොලොව් ය.

(3) මල් මෝස්තර මැසීම ය. (4) බීරළු රේන්ද ඇල්ලීම ය.

8. මින් කවර මැහුම් ක්‍රමයක් පිස්මේන්තු මැස්ම මසා ආරම්භ කරන්නේ ද,

(1) බ්ලැන්කට් මැසීමේදී ය. (2) වාටි මැසීමේදී ය.

(3) සිහින් නූල් දුවවීමේදී ය. (4) නූල් ඇදීමේදී ය

9. රෙදි දෙපොටක් මැසීමට පෙර එකට රඳවා තබා ගැනීමට යොදනු ලබන මැහුම් ක්‍රමය වන්නේ ,

(1) නූල් දුව වීම ය. (2) පිස්මේන්තු මැස්ම ය.

(3) දම්වැල් මැස්ම ය. (4) සිහින් නූල් දුවීම ය.

10. **A,B,C** ලෙස දක්වා ඇති මෙම මැහුම් ක්‍රම වල නිවැරදි අනු පිළිවෙල වන්නේ,


A


B


C

(1) කතිර මැස්ම, ප්‍රංශ ගැට මැස්ම සහ දම්වැල් මැස්ම ය .

(2) හුරුළුකටු මැස්ම, බූලියන් මැස්ම සහ නැට් මැස්ම ය.

(3) බූලියන් මැස්ම, හුරුළුකටු මැස්ම සහ කතිර මැස්ම ය.

(4) හුරුළුකටු මැස්ම , ප්‍රංශ ගැට මැස්ම සහ නැට් මැස්ම ය.

11. ඇඳුමක වාටියට විකර්ණාකාර පටියක් අල්ලා, අඩක් පිටතට පෙනෙන සේ නවා පළමු මැස්ම මත තබා මැසීම හඳුන්වන්නේ,

(1) පයිපින් කිරීම ලෙස ය . (2) පෝරුවක් යෙදීම ලෙස ය .

(3) බන්ධන යෙදීම ලෙස ය. (4) වාටි මැස්ම මැසීම ලෙස ය

12.



ඉහත රූප සටහනේ දැක්වෙන්නේ,

(1) පැතලි මූට්ටුව ය. (2) ප්‍රංශ මූට්ටුව ය .

(3) විවෘත පැතලි මූට්ටුව ය. (4) අතිච්ඡාදන මූට්ටුව ය.

13. ඇඳුමක් කැපීමට පෙර රෙද්දේ විකර්ණයේ දෙකලවරින් ඇද උණුසුම් ස්ත්‍රික්කයකින් මදිනු ලැබීමේ අරමුණ වන්නේ,

(1) රෙද්දේ ඇද ඉවත් කර ගැනීමට ය. (2) රෙද්දේ කැද ඉවත් කර ගැනීමට ය.

(3) සිනිඳු මතුපිටක් ලබා ගැනීමට ය . (4) මැදීමේ පහසුව සඳහා ය.

14. රෙදිපිළි තාක්ෂණය පිළිබඳ ශිෂ්‍යාවක් විසින් ලියන ලද තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A - පැතලි මූට්ටුව මැසීමෙන් පසු නිර්මාණයේ ඉදිරිපස දෙසට මූට්ටුව හැරවිය යුතු ය .

B - මසන ලද උපාංගයේ මතුපිට මෘදු ස්වභාවයක් ලබා දීමට ක්විල්ට් කළ හැකි ය.

C - මූලික මැහුම් ක්‍රම ලෙස සන්නාලි මැස්ම, සැටින් මැස්ම හා පිස්මේන්තු මැස්ම නම් කළ හැකි ය.

D - බොහෝ පාසල් නිල ඇඳුම් වල සාය කොටස සඳහා පිහිතල පොලොව් යොදා ගෙන ඇත.

E - බඳන යෙදීමට හා පයිපින් කිරීමට විකර්ණාකාර පටි යොදා ගත හැකි ය.

මින් නිවැරදි වැකි වන්නේ,

(1) A,Bහා C ය. (1) C,Dහා E ය. (1) B,DහාE ය. (1) A,Cහා E ය.

15. ගෘහීය උපාංග නිර්මාණය සඳහා වඩාත් සුදුසු රෙදි වර්ග දැක්වෙන කාණ්ඩය වන්නේ,

(1) රෙයෝන්, සේද, පොලියෙස්ටර් හා කපු ය.

(2) කපු , පොලියෙස්ටර්, සේද හා ලිනන් ය.

(3) අමු රෙදි ,පොප්ලින් ,ලිනන් හා කපු ය.

(4) ලිනන්, රෙයෝන් ,අමු රෙදි හා නයිලෝන්ය.

16. තක්කාලි ගෙඩියක හැඩය ගත් අත්පිස්නා රදවනයක වටා මැසීම සඳහා , රෙද්දකින් පටි කපා ගැනීමේ දී සිසුන් අනුගමනය කළ යුතු වන්නේ,



A B C D

(1) A (2) B (3) C (4) D

17. ලිපි රදවනයක් අලංකාර කිරීම සඳහා වර්ණවත් මුදිත රෙදි කොටස් මෝස්තරයට අනුව තබා මසා නිම කිරීම හඳුන්වන්නේ ,

(1) එම්බ්‍රොයිඩර් කිරීම ලෙස ය. (2) ක්විල්ට් කිරීම ලෙස ය.

(3) අක්සැරසිලි යෙදීම ලෙස ය. (4) ආරෝපණය කිරීම ලෙස ය.

18. ළදරු ගවුම/ කමිසය මසා නිම කිරීමේ නිවැරදි අනුපිළිවෙල වන්නේ,

(1) උරහිස , විවරය, කර ,අත් කට සහ වාටිය මැසීම ය.

(2) උරහිස, කර , අත්කට ,විවරය සහ වාටිය මැසීම ය .

(3) උරහිස , කර, විවරය, අත්කට සහ වාටිය මැසීම ය .

(4) උරහිස , අත්කට ,විවරය, කර සහ වාටිය මැසීම ය .

19. ළදරු ඇඳුම මැසීමට රෙදි තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු වන්නේ,

(1) කුඩා මෝස්තර හා තද වර්ණ වීම.

(2) කුඩා මෝස්තර හා ලා වර්ණ වීම.

(3) විශාල මෝස්තර හා තද වර්ණ වීම.

(4) විශාල මෝස්තර හා ළා වර්ණ වීම.

20. ළදරු ඇඳුමේ උරහිස් මැසීමට සුදුසු මූට්ටුව වන්නේ

(1) පැතලි මූට්ටුව ය. (2) ප්‍රංශ මූට්ටුව ය .

(3) අතිච්ඡාදන මූට්ටුව ය . (4) සරල මූට්ටුව ය.

(නිවැරැදි පිළිතුරට ලකුණු **1** බැගින් හිමිවේ.)

**ව්‍යුහගත ප්‍රශ්න**

1 i. ළදරු ඇඳුම් සඳහා රෙදි තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු **තුනක්** සඳහන් කරන්න . (ලකුණු 03යි)

ii. බෝතල් ආවරණයක් මැසීමේදී ක්විල්ට් කිරීම යොදා ගැනීමෙන් සැලසෙන වාසි **තුනක්** සඳහන් කරන්න.

( ලකුණු 03යි)

iii (a). ළදරු ඇඳුමක කර හා වාටිය අලංකාර කිරීමට යොදා ගත හැකි ක්‍රම **හතරක්** නම් කරන්න.

(ලකුණු 02යි)

( b). ළදරු ඇඳුමේ පපු කොටස විසිතුරු කිරීමට ලේසි ඩේසි මැස්මට ගැලපෙන මෝස්තරයක් ඇඳ දක්වන්න.

(ලකුණු 02යි)

( මුළු ලකුණු 10යි)

2 i. ඇඳුමක විවර පියවීම සඳහා යොදා ගතහැකි ක්‍රම **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 3යි)

ii. ශාකමය කෙඳි වර්ග **තුනක්** නම් කර ,ඒවා ශාකයේ කුමන කොටසින් ලබා ගන්නේ දැයි සඳහන් කරන්න.

(ලකුණු 3යි)

iii. මැහුම් කලාව තුළින් උපාංග නිර්මාණයට යොමු වීමෙන් ,ඔබට සැලසෙන වාසි **හතරක්** පැහැදිලි කරන්න.

(ලකුණු 4යි)

( මුළු ලකුණු 10යි)

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - 4 | (6) - 2 | (11) - 3 | (16) - 2 |
| (2) - 4 | (7) - 4 | (12) - 4 | (17) - 4 |
| (3) - 1 | (8) - 3 | (13) - 1 | (18) - 1 |
| (4) - 2 | (9) - 1 | (14) - 3 | (19) - 2 |
| (5) - 4 | (10) - 2 | (15) - 3 | (20) - 1 |

## ව්‍යුහගත පිළිතුරු පත්‍රය

1 i.

- සිනිඳු හා මෘදු බවකින් යුක්ත වීම.
- නිතර සේදීමට හා මැදීම සඳහා ඉහළ උෂ්ණත්වයකට ලක් කළ හැකි වීම.
- තෙතමනය හා දහඩිය අවශෝෂණය කළ හැකි වීම.

( කරුණු 3ට ලකුණු 03 යි.)

ii.

- බෝතල් ආවරණයට මෘදු මතුපිටක්, ස්වභාවයක් ලබාදීම .
- අලංකාරයක් ලබා දීම.
- වැටීමක දී වීදුරු බෝතලය බිඳීම වැළැක්වීම.
- බෝතලය තුළ ඇති පානයේ උණුසුම ටික වේලාවක් රඳා සිටීමට හැකි වීම. ( කරුණු 3ට ලකුණු 03යි.)

iii ( a. )

- ගැලපෙන වර්ණවත් නූලකින් බ්ලැන්කට් මැස්ම මැසීම.
- ඉදිකටු රේන්දය මැසීම.
- සිහින් කපු රේන්දයක් ඇල්ලීම.
- ඇඹරුම් වාටිය යෙදීම.
- සිප්පි වාටිය මැසීම .
- බීක්කු මැසීම.
- රෙද්ද නවා වාටි මැසීම. (කරුණු 4ට ලකුණු 2යි. )

( b.)   ලේසි ඩේසි මැස්මට ගැලපෙන කුඩා  මෝස්තරක් ඇඳීමට      (ලකුණු 2 යි. )





( ලකුණු 4 යි.)

(මුළු ලකුණු 10 යි.)

2   i.

- දෙපෙති ජන්තු ඇල්ලීම.
- බොත්තම් හා කාස මැසීම.
- හක් සහ මුදු ඇල්ලීම .
- සැනගාංචු (Zip) ඇල්ලීම.
- ටේප් ඇල්ලීම .          (කරුණු 3ට ලකුණු 3යි.)

ii.

- කපු - ගෙඩියේ පුළුන් .
- ලිනන්  - ෆැලැක්ස් ගසේ කඳෙන් .
- හණ  - පත්‍ර මගින්.
- නියද - පත්‍ර මගින්.
- රැමී - පත්‍ර මගින්.          (කරුණු 3ට ලකුණු 3යි.)

iii .

- අපතේ යන රෙදි කැබලි වලින් ප්‍රයෝජනයක් ගැනීමට.
- නිවසට ක්‍රමවත් හා අලංකාරයක් ලබා ගැනීමට .
- උපාංග නිර්මාණය තුළින් ස්වයං  රැකියාවකට යොමු වීමට.
- විවේකය ඵලදායි ලෙස ගත කිරීමට.
- උපාංග නිර්මාණයට යොමු වීම තුලින් මානසික තෘප්තියක් ලබා ගැනීමට.

(කරුණු 4ක් පැහැදිලි කිරීමට ලකුණු 4යි.)

(මුළු ලකුණු 10 යි.)